අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

අ.පොෂ.(සාමාන්‍ය පෙළ) උපකාරක තක්සේරුව 2026

ශිල්ප කලා I , II	84	S	කාලය පැය 03

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1),(2),(3),(4) යන පිළිතුරු අතරින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර** තෝරා ගන්න.
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න**

1.දේශීය හා විදේශීය වෙළඳපොළෙහි විශාල ඉල්ලුමක් පවතින පරිසර හිතකාමී කෙඳි ආශ්‍රිත අත්කම් නිර්මාණ නිෂ්පාදනය කරනු ලබන්නේ,

1) කෙඳි වියළා, විවිධ වර්ණ ගන්වා, වියාගැනීමෙන් ය.
2) කෙඳි තම්බා, වියළා වර්ණ ගන්වා, වියාගැනීමෙන් ය.
3) කෙඳි තම්බා, වර්ණ ගන්වා, වියළා වියාගැනීමෙන් ය.
4) කෙඳි මගින් වියා, වියළා වර්ණ ගන්වා, තම්බාගැනීමෙන් ය.

2.ජ්‍යාමිතික ඇඳීමේදී ඕනෑම රේඛාවක් සමාන කොටස් වලට නිවැරදිව බෙදා ගැනීමටත් ,මිනුම් පරීක්ෂා කිරීමටත් භාවිතා කරන උපකරණය කුමක්ද?

1) බෙදුම් කටුව ය. 2) කවකටුව ය. 3) පුවරු කටු ය. 4) කෝණමාන ය.

3.ඝනවස්තූන් උපයෝගී කර අඳිනු ලබන ඝන ජ්‍යාමිතික නිර්මාණ වල සැඟි දාර දැක්වීම සඳහා භාවිතා කරන රේඛා වර්ගය තෝරන්න.

1)ඝන අඛණ්ඩ රේඛා වේ. 2) සිහින් අඛණ්ඩ රේඛා වේ.

3) සිහින් දාම රේඛා වේ. 4) කඩ රේඛා වේ.

4.යම්කිසි අචල ලක්ෂයකට සම දුරින් පිහිටි තවත් ලක්ෂයක ගමන් පථය වෘත්තය ලෙස හඳුන්වන අතර පහත රූප සටහනේ දැක්වෙන වෘත්තයක කොටස් දෙක නිවැරදිව අර්ථ දැක්වෙන පිළිතුර තෝරන්න.



1) මහා වෘත්ත ඛණ්ඩය හා කුඩා වෘත්ත ඛණ්ඩය.
2) කේන්ද්‍රික ඛණ්ඩය හා කුඩා වෘත්ත ඛණ්ඩය.
3) මහා වෘත්ත ඛණ්ඩය හා අර්ධ වෘත්තය.
4) වෘත්ත පාදය හා අභිලම්භය.

5. රූපයේ දක්වා ඇති ජ්‍යාමිතික නිර්මාණය හඳුන්වන පිළිතුර කුමක්ද?



1) සුළු කෝණය සමාන කොටස්වලට බෙදීම ය.
2) සරල රේඛාව සමාන කොටස්වලට බෙදීම ය.
3) සරල රේඛාව සමාන කොටස් පහකට බෙදීම ය.
4) සරල රේඛා දෙකක් එකිනෙකට සම්බන්ධ කිරීම ය.

Past Papers Wiki

6.පහත ලක්ෂණ සහිත සමාන්තරාස්‍රය තෝරන්න.

- සම්මුඛ පාද සමාන්තර වේ.
- පාද සමාන වන අතර සම්මුඛ කෝණ සමාන වේ.

1) සමචතුරස්‍රය. 2) රොම්බසය. 3) රොම්බාභය. 4) සෘජුකෝණාස්‍රය.

7.සිලින්ඩරයක විකසනය නිර්මාණය කිරීමේදී විකසන රේඛාව ඇඳීමට වඩාත් සුදුසු වන්නේ,

1) සිලින්ඩරයේ පරිධියට සමාන දුරක් ලබා ගැනීම ය.
2) සිලින්ඩරයේ උසට සමාන දුරක් ලබා ගැනීම ය.
3) සිලින්ඩරයේ පැති පෙනුමට සමාන දුරක් ලබා ගැනීම ය.
4) වෘත්තයේ අරයට සමාන දුරක් ලබා ගැනීම ය.

8.වෘත්තයක අරය වෙනස් නොකර පරිධිය සමාන කොටස් වලට බෙදා නිර්මාණය කළ හැකි බහුඅස්‍රය කුමක්ද?

1) පංචාස්‍රය. 2) සමචතුරස්‍රය. 3) සප්තාස්‍රය. 4) ෂඩාස්‍රය.

9. රූප සටහනේ දක්වා ඇති අක්ෂරයෙන් දක්වෙන අක්ෂය හඳුන්වනු ලබන්නේ,

1) මහා අක්ෂය නමිනි.
2) සුළු අක්ෂය නමිනි.
3) නාභිය නමිනි.
4) නියාමක අක්ෂය නමිනි.



10.ලෝකයේ ජනප්‍රිය පා පන්දු ක්‍රීඩාවේ පන්දුව නිර්මාණය කිරීමට භාවිතා කර ඇති බහුස්‍රය ඇතුළත් වරණය තෝරන්න.

1) පංචාස්‍රය හා සප්තාස්‍රය. 2) ෂඩාස්‍රය පමණි.
3) පංචාස්‍රය හා ෂඩාස්‍රය. 4) පංචාස්‍රය පමණි.



11.රෙදි මුද්‍රණ ක්‍රියාවලියේ ප්‍රධාන මාධ්‍ය වන සායම් වර්ග හා වර්ණ සංකලනය පිළිබඳ දැනුවත්වීම වැදගත් ය.ඒ අනුව රතු රඹ වර්ණය සැකසීමට අවශ්‍ය වර්ණ වන්නේ,

1) රතු හා දම් ය. 2) රතු හා තැඹිලි ය. 3) රතු හා කහ ය. 4) කහ හා රතු ය.

12.රෙදි විවීමේදී ශාක කෙඳි වලින් තැනූ නූල් වලට කැඳ දැමීම සිදු කරයි.කැඳ දැමීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් **නොවන්නේ,**

1) සායම් උරා ගැනීම අපහසු වීම ය. 2) නූලේ ශක්තිමත් භාවය වැඩි වීම ය.
3) නූල්වලට වන හානිය අවම වීම ය. 4) නූල් කැඩී යාම අවම වීම ය.

13.පහත රූපයේ ඇති මෝස්තරය මුද්‍රණය කර ගැනීමට භාවිතා කළ හැකි අච්චු වර්ගය වන්නේ,

1) නිර්මිත අච්චු වේ. 2) ස්වභාවික අච්චු වේ.
3) සිදුරු තහඩු වේ. 4) ඩිජිටල් මුද්‍රණය වේ.



14.තාප බන්ධිත ක්‍රමවේදයට කපු රෙදි කැබැල්ලක් අලංකරණය කිරීම සඳහා වඩාත් සුදුසු කඩදාසිය වන්නේ,

1) නිල් ලේඛලය සහිත කඩදාසිය ය.
2) කොළ ලේඛලය සහිත කඩදාසිය ය.
3) දම් ලේඛලය සහිත කඩදාසිය ය.
4) රතු ලේඛලය සහිත කඩදාසිය ය.

15.දැන්වීම්,පෝස්ටර්,ආරාධනා පත්‍ර මුද්‍රණය කිරීම සඳහා සැලසුම් කළ හැකි වඩාත් සුදුසු මුද්‍රණ ක්‍රමය වන්නේ,

1) සිදුරු තහඩු මුද්‍රණය ය.
2) අච්චු මුද්‍රණය ය.
3) තිර රාමු මුද්‍රණය ය.
4) අතින් පින්තාරු ක්‍රමය ය.

16.පහතින් දැක්වෙන්නේ බතික් ක්‍රියාවලියේදී යොදාගන්නා පියවර කිහිපයකි,

A - මෝස්තරයේ කොටස් ඉටි ගැන්වීම.

B - මෝස්තරය සහිත රෙදිකඩ රාමුවට සවි කිරීම.

C - සායම් මිශ්‍රණය සැකසීම.

D - වර්ණ ගන්වා වියළීම.

E - ඉටි මිශ්‍රණය සැකසීම.

එම ක්‍රියාවලියේ පියවර අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

1) ECBAD
2) BEDAC
3) BCAED
4) BEACD

17.ජල ආකර්ෂණතාවය අධික වන තාප බලපෑම් වලට හා විද්‍යුත් ආරෝපණයට ප්‍රතිරෝධයක් දක්වන ස්වභාවික කෙඳි වර්ගය කුමක්ද?

1) හණ කෙඳි ය.
2) කපු කෙඳි ය.
3) ජූට් කෙඳි ය.
4) නියඳ කෙඳි ය.

18.සෙන්ටිමීටර් 100ක් දිගැති විසිතුරු ඉන පටියක් වියා ගැනීම සඳහා හැඩපෙති 12ක් භාවිතා කරයි.එයට අවශ්‍ය නූල් ප්‍රමාණය කොපමණදැයි නිගමනය කරන්න.

1) 48 කි.
2) 12 කි.
3) 24 කි.
4) 120 කි.

19.මෙට්‍රික් අංක 18^{s} වූ නූල් මිටියක බර කිලෝග්‍රෑම් 5කි.එම නූල් මිටියේ අඩංගු නූල් කැරලි ගණන කොපමණද?

1) 120 කි.
2) 90 කි.
3) 100 කි.
4) 80 කි.

20.අත්පිස්නා හැදයක් විවීම සඳහා දෙපට නූල් කැරලි 60ක් වැය වී ඇත.නූල් කිලෝග්‍රෑම් එකක එම නූල් කැරලි 50ක් අඩංගු වන්නේ නම් එම නූලේ අංකය වන්නේ,

1) $2/120^{S}$ ය.
2) 60^{S} ය.
3) 50^{S} ය.
4) $2/100^{S}$ ය.

21.සෙන්ටිමීටර එකකට නූල් 40 බැගින් යොදා මෙට්‍රික් අංක $2/20^{s}$ දෙපට නූල් භාවිතා කර මීටර 50ක් දිග නූල් හැඳයක් සූදානම් කර ඇත.එහි පළල සෙන්ටිමීටර 30ක් නම් හැඳයට අවශ්‍ය නූල් පොටවල් ගණන වන්නේ,

1) 40×30 = 1200 ය. 2) 40×50 = 2000 ය. 3) 20×50 = 1000 ය. 4).20×40 = 800 ය.

22. මේස ඇතිරිල්ලක් විවීම සඳහා දික් නූල් දෙකක් සහ හරස් නූල් එකක් ලෙස යොදා වියමන් ක්‍රමයක් භාවිතයට ගෙන ඇත.එම වියමන් රටාවේ නූල් මතු වීම පහත දැක්වෙන රූප සටහන් අතුරින් තෝරන්න.


1)


2)


3)


4)

23.විවිධ ප්‍රමාණ වලින් යුත් රෙදි නිෂ්පාදනය කිරීමට විවිධ යන්ත්‍ර භාවිතා කරයි.සාමාන්‍ය පළලකින් යුත් තුවා වැනි රෙදි වියා ගැනීම සඳහා භාවිතා කරන රෙදි විවීමේ යන්ත්‍රය තෝරන්න.

1) චාම් යන්ත්‍රය ය. 2) මේස යන්ත්‍රය ය. 3) ජවනඩා යන්ත්‍රය ය. 4) බලවේග යන්ත්‍රය ය.

24.අන් පිස්නා නිෂ්පාදනයේදී ජලය උරාගැනීමේ හැකියාව පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වයි. ජලය උරාගැනීමේ හැකියාව වැඩි රෙදි විවීම සඳහා යොදා ගන්නා වියමන් රටාව තෝරන්න.


1)


2)


3)


4)

25.අන් යන්ත්‍ර රෙදි විවීමේ ක්‍රියාවලියේදී , ජවනඩා යන්ත්‍රවල කම්බි ආධාරයෙන් ලීවර රදවා ගනු ලබන යන්ත්‍ර කොටස හඳුන්වනු ලබන්නේ,

1) යන්ත්‍ර රාමුව නමින් ය. 2) පොරෝදු රාමුව නමින් ය.

3) ලීවර නමින් ය. 4) අලුව නමින් ය.

26. මැටි ලෙස සලකනු ලබන ජීර්ණයට පත් වූ ෆෙල්ඩ්ස්පාර් පාෂාණයක කුඩා කලීලමය අංශුවල පරිමාව කොපමණද?

1) 0.02mm වේ. 2) 0.2mm වේ. 3) 0.020mm වේ. 4) 0.002mm වේ.

27.මැටි මිශ්‍රණයක හැකිළීමේ ප්‍රතිශතය වැඩි වූ විට යොදාගත හැකි වඩාත් සුදුසු නොඇලෙන සුළු අමුද්‍රව්‍යය කුමක්ද?

1) කෙඔලින් ය. 2) බෝලමැටි ය. 3) ෆෙල්ඩ්ස්පාර් ය. 4) බෙන්තොනයිට් ය.

28.ඇඹීමේ ක්‍රමයට මැටි භාණ්ඩයක් නිර්මාණය කිරීමේදී ප්‍රථමයෙන්ම සැලසුම් කළ යුතු පියවර වන්නේ,

1) සැකිල්ල සාදා ගැනීමය. 2) ක්‍රමානුකූලව මැටි තබා ගැනීමය.

3) දළ සටහනක් ඇඳ ගැනීමය. 4) සමබරතාවය පිළිබඳ සලකා බැලීමය.

29. **A-මැටි පිඬ මධ්‍යගත කිරීම.**

B- මැටි පිඬ සකපෝරුව මත සවි කිරීම.

C - නිමහම් කිරීම.

D - බදුනේ බිත්ති ඉහළට එසවීම.

සකපෝරුව භාවිතයෙන් භාණ්ඩයක් ඉදි කිරීමේ පියවර අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

1) BADC ය. 2) BDAC ය. 3) BCDA ය. 4) ABCD ය.

30.ඔක්සිජන් වායුව සහිත පරිසරයක් තුළ මැටි භාණ්ඩ පිළිස්සීම සිදුවන අවස්ථාව නිවැරදිව අර්ථ දැක්වෙන වරණය තෝරන්න.

1) ඔක්සිහරණ අවස්ථාව. 2) ඔක්සිකරණ අවස්ථාව.

3) වර්ණ විපර්යාස අවස්ථාව. 4) සංකෝචන අවස්ථාව.

31.ආහාර පාන සඳහා භාවිතා වන භාජනවලට අඩු උෂ්ණත්වය ඔප මිශ්‍රණ භාවිතා නොකිරීමට හේතුව කුමක්ද?

1) කැල්සියම් කාබනේට් භාවිතය නිසා ය. 2) ලෙඩ් ඔක්සයිඩ් භාවිතය නිසා ය.

3) විවිධ අළු වර්ග භාවිතය නිසා ය. 4) ඩොලමයිට් භාවිතය නිසා ය.

32.පහත දැක්වෙන රූප සටහනින් දැක්වෙන මෝස්තරය භාවිතා කළ හැක්කේ කුමන අත්කම් නිර්මාණයට ද?



1) රිබන් එම්බ්‍රොයිඩර් නිර්මාණයට ය.
2) නෙට් වර්ක් නිර්මාණයට ය.
3) විසිතුරු මැහුම් ක්‍රම නිර්මාණයට ය.
4) පැච්වර්ක් නිර්මාණයට ය.

33. රිබන් භාවිතයෙන් විවිධ නිර්මාණ සිදු කිරීමේදී අයිඩා රෙදිවල මැසීම සඳහා භාවිතා වන ඉදිකටු වර්ගය කුමක්ද?

1) මොට තුඩ රහිත ස්ටැප්ස්ට් ඉඳිකටුව ය. 2) උල් තුඩ සහිත මල් මහන ඉඳිකටුව ය.

3) උල් තුඩ සහිත ස්ටැප්ස්ට් ඉඳිකටුව ය. 4) මොට තුඩ සහිත ස්ටැප්ස්ට් ඉඳිකටුව ය.

34.වූල් නිර්මාණ ගෙනීමේදී විවිධ මානවලින් යුතු ගෙතුම් කටු වෙළඳපොළෙන් ලබා ගත හැකිය.ළඳරු තොප්පිය ගෙනීමේදී යොදාගන්නා ගොතන කටුවේ අංකය කීයද?

1) නො. 12 ය. 2) නො. 10 ය. 3) නො. 14 ය. 4) නො. 13 ය.

35.මල් මාලා හා මල් කළඹ සකස් කිරීමේදී මල් හා කොළ ඉති වියළීම වළක්වා ගැනීමට යෙදිය හැකි වඩාත් සුදුසු උපක්‍රමය කුමක්ද?

1) ජලයෙන් පොඟවාගත් වෙට්ෆෝම් නටුවට තබා ඔතා ගැනීමය.
2) ඇස්ප්‍රීන් මිශ්‍ර ජලයේ වෙට්ෆෝම් ගිල්වා තැබීමය.
3) ජලයෙන් පොඟවා ගත් තෙත පුළුන් නටුවට ඔතා ගැනීමය.
4) සබන් මිශ්‍ර ජලයේ පුළුන් ගිල්වා තැබීමය.

36.කෘත්‍රිම ආභරණ නිර්මාණයේදී පබළු අමුණා ගැනීම සඳහා විවිධ නූල් වර්ග භාවිතා කරයි.අත් පළඳනාවක් සැකසීම සඳහා වඩාත් සුදුසු නූල් වර්ග ඇති වරණය තෝරන්න.

1) තංගුස් නූල්, වූල් නූල්, කෝඩ් නූල් වේ. 2) තංගුස් නූල්, නයිලෝන් නූල්, සිහින් කම්බි වේ.

3) කැරලි නූල්, නයිලෝන් නූල්, කෝඩ් නූල් වේ. 4) තංගුස් නූල්, නයිලෝන් නූල්, කැරලි නූල් වේ.

37.සැහැල්ලු සුරතල් සතුන් නිර්මාණය කිරීමේදී පතොරොම සඳහා තැබිය යුතු මැහුම් වාසියේ ප්‍රමාණය වන්නේ,

1) 0.5cm ය. 2) 1cm ය. 3) 1.5cm ය. 4) 2cm ය.

38.සැහැල්ලු සෙල්ලම් භාණ්ඩයක් වන **පෙන්ගුවින්** නිර්මාණයේදී වඩාත් සුදුසු රෙදි වර්ගය වන්නේ,

1) බෝවා රෙදි ය. 2) වෙල්බෝවා රෙදි ය.

3) හයිෆයිල් රෙදි ය. 4) ෆෙල්ට් රෙදි ය.

39.කඩදාසි මල් ඉටි ගැල්වීමේ දී ඉටි මිශ්‍රණය වතුර භාජනයක බහා උණු කිරීමට හේතුව කුමක්ද?

1) ඉටි ඉක්මනින් දිය නොවන නිසා ය. 2) ඉටි වර්ණය වෙනස් වන නිසා ය.

3) ඉටි ගිනි ඇවිළීම සිදුවන නිසා ය. 4) ඉටිවලින් කළු දුම පිටවන නිසා ය.

40.උද්‍යාන අලංකරණ ප්‍රතිමා සැකසීමේ දී ප්‍රතිමාවක හැඩය සකසා ගැනීමට භාවිතා කරන දැල් වර්ගය වන්නේ,

1) මැක්සි දැල ය. 2) කොටු දැල ය. 3) කුකුළු දැල ය. 4) කම්බි දැල ය.

අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

අ.පොෂ.(සාමාන්‍ය පෙළ) උපකාරක තක්සේරුව 2026

ශිල්ප කලා II , I	84	S

පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. කලාප අධ්‍යාපන කාර්යාලය විසින් සංවිධානය කරනු ලබන ශිල්ප කලා ප්‍රදර්ශනය සඳහා ඔබ පාසලේ සියලු ම සිසුන් සහභාගී කර විය යුතු බවට විෂය අධ්‍යක්ෂ දැනුම් දී ඇත.
   i. ප්‍රදර්ශනය පිළිබඳව පාසලේ සිසුන් දැනුවත් කිරීමට සුදුසු පෝස්ටරයක ආකෘතියක් ඇඳ දක්වන්න.
   ii. කඩදාසි මාධ්‍යයෙන් නිර්මාණය කරන ලද ආරාධනා පත්‍රයක මුහුණතෙහි සැලසුමක් ඇඳ දක්වන්න.
   iii. තම පාසලේ සිසුන් හඳුනා ගැනීමට නිර්මාණශීලී ලාංඡනයක් ඇඳ දක්වන්න.
   iv. උත්සවය ආරම්භයේ දී දැල්වීමට නියමිත පොල්තෙල් පහන සැකසුම සඳහා භාවිත කළ හැකි ස්වාභාවික ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.
   v. ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කිරීමට ආභරණ කට්ටල නිර්මාණයට සුදුසු අමුද්‍රව්‍ය දෙකක් නම් කරන්න.
   vi. නිවේදක පුවරුව අලංකාර කිරීම සඳහා නිර්මාණය කළ හැකි මල් සැකසුමක ආකෘතියක් අඳින්න.
   vii. සංවිධායක මණ්ඩලය වෙනුවෙන් ටී ෂර්ට් එකක් නිර්මාණය කිරීම සඳහා සුදුසු මුද්‍රණ ක්‍රම දෙකක් නම් කරන්න.
   viii. මේස දරණු (table mat)නිර්මාණය කිරීම සඳහා යොදාගත හැකි වියමන් රටා දෙකක් නම් කරන්න.
   ix. සමරු ඵලකයක් ඇසිරීම සඳහා යෝග්‍ය ඇසුරුමක රූපීය පෙනුම ඇඳ දක්වන්න.
   x. මේස දරණුවක නිෂ්පාදන වියදම රුපියල් 400.00 ක් වන අතර එකක් 15 % ක ලාභයක් සහිතව විකිණීමට අපේක්ෂිත ය.එහි විකුණුම් මිල ගණනය කරන්න.

(2× 10 = ලකුණු 20)

2. විවිධ නිර්මාණ සැලසුම් කිරීමේ දී ජ්‍යාමිතික හැඩතල භාවිත කිරීම සිදු කරයි.
   i. අරය සෙන්ටිමීටර 5 ක වෘත්තයක් ඇඳ සමාන කොටස් 12 කට බෙදා දක්වන්න. (ලකුණු 2)
   ii. පහත චතුරස්‍රවල ලක්ෂණ දෙක බැගින් ලියන්න.
   A - ආයත චතුරස්‍රය B - රොම්බාභය (ලකුණු 4)
   iii. පාදයක දිග සෙන්ටිමීටර 6 ක් වූ පංචාස්‍රයක් සුදුසු ක්‍රමවේදයක් භාවිත කර නිර්මාණය කරන්න. (ලකුණු 4)

3. ගෘහ අලංකරණ කටයුතු සඳහා විවිධ නිර්මාණ භාවිතයට ගනියි.
   i. රිබන් එම්බ්‍රොයිඩර් නිර්මාණ කිරීමේ දී සුදුසු මැහුම් ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු 2)
   ii. මල් සැකසුම් සඳහා යොදාගන්නා ස්වාභාවික මල්වල වාසි හා අවාසි දෙක බැගින් ලියන්න. (ලකුණු 4)

iii. නිර රාමු මුද්‍රණ ක්‍රමය (screen printing) භාවිතයෙන් කොට්ට උරයක් නිර්මාණශීලීව අලංකාර කරගන්නා ආකාරය පියවර අනුව ලියන්න. (ලකුණු 4)

4. අත් පිස්නා හැදයක් විවීම සඳහා සකස් කරන ලද නූල් හැදයක දළ රූප සටහන සහ විස්තරය පහත දැක්වේ.

- හැදයක දිග මීටර 50 කි.
- හැදයේ පළල සෙන්ටිමීටර 40 කි.
- එක් සෙන්ටිමීටරයකට යොදන දික් නූල් ගණන 60 කි.
- දික් නූල් අංකය 2/ 40^s ක් වේ.



i. අත් පිස්නා විවීම සඳහා සුදුසු වියමන් රටා දෙකක් නම් කරන්න. (ලකුණු 2)
ii. ඉහත (i) සඳහන් වියමන් රටා දෙක ප්‍රස්තාර ගත කර දක්වන්න. (ලකුණු 4)
iii. අත් පිස්නා හැදය විවීමට අවශ්‍ය දික් නූල් ප්‍රමාණයේ බර ගණනය කරන්න. (ලකුණු 4)

5. රෙදි පිළි නිෂ්පාදනයේ දී රෙදි විවීම මෙන් ම අලංකරණය පිළිබඳව ද අවධානය යොමු කිරීම වැදගත් වේ.

i. නූල් හැදයක් යන්ත්‍රගත කිරීමේ දී , නූල් එතීම සඳහා භාවිත කරන උපකරණ දෙකක් නම් කරන්න. (ලකුණු 2)
ii. පෙර පිරියම් කිරීමේ ක්‍රම 2 ක් නම් කර ඉන් එක් ක්‍රමයක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 4)
iii. සැහැල්ලු සෙල්ලම් බඩු නිර්මාණය කිරීමේ දී පෙන්ගුවින් සකස් කරගන්නා ආකාරය පියවර වශයෙන් දක්වන්න. (ලකුණු 4)

6. භූගත සම්පතක් වන මැටි නිධි වශයෙන් පොළොවේ තැන්පත්ව ඇති අතර ඒවා හාරා පිටතට ගෙන පදම් කොට භාණ්ඩ නිෂ්පාදනය කරයි.

i. මූලික පිළිස්සීම පමණක් සිදු කර භාවිතයට ගත හැකි භාණ්ඩ දෙකක් නම් කරන්න (ලකුණු 2)
ii. පළමු පිළිස්සීමෙන් පසු මැටි භාණ්ඩ සඳහා යෙදිය හැකි අලංකරණ ක්‍රම හතරක් ලියන්න. (ලකුණු 4)
iii. මැටි දරණු හෝ තහඩු භාවිත කර ඔබ කැමති භාණ්ඩයක් නිර්මාණය කරන අයුරු රූප සටහන් සහිතව විස්තර කරන්න. (ලකුණු 4)

7. වර්තමාන සමාජයේ උද්‍යාන අලංකරණ නිර්මාණ සඳහා වැඩි ඉල්ලුමක් පවතී.

i. උද්‍යාන මූර්ති ගොඩනැගීමේ ශිල්පීය ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු 2)
ii. උද්‍යාන විද්‍යා මූලධර්ම හතරක් නම් කර ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)
iii. පාසල් පුස්තකාලය ඉදිරිපිට උද්‍යානය අලංකාර කිරීම සඳහා සුදුසු බිතු කැටයමක් නිර්මාණය කරන්න. (ලකුණු 4)

PAST PAPERS WIKI

අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

අ.පොෂ.ස.(සාමාන්‍ය පෙළ) උපකාරක තක්සේරුව 2026

ශිල්ප කලා - පිළිතුරු පත්‍රය

I කොටස

ප්‍රශ්න අංකය	පිළිතුරෙහි අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරෙහි අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරෙහි අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරෙහි අංකය
01.	2	11.	2	21.	1	31.	2
02.	1	12.	1	22.	3	32.	4
03.	4	13.	1	23.	1	33.	4
04.	1	14.	4	24.	2	34.	1
05.	3	15.	3	25.	2	35.	3
06.	2	16.	4	26.	4	36.	2
07.	1	17.	2	27.	3	37.	2
08.	4	18.	1	28.	3	38.	4
09.	4	19.	2	29.	1	39.	3
10.	3	20.	4	30.	2	40.	3

II කොටස

1.

i. තේමාවට ගැළපෙන පෝස්ටරයක්,දිනය, වේලාව , ස්ථානය සඳහන් කර තිබීම.

ii. තේමාවට ගැළපෙන ආරාධනා පත්‍රයක මුහුණතට ගැළපෙන චිත්‍රයක් ඇඳ තිබීම.

iii. නිර්මාණශීලීව ඇඳ ඇති ලාංඡනයක් සඳහා ලකුණු ලබා දෙන්න.

iv. පොල්තෙල් පහනක් සඳහා ස්වාභාවික ද්‍රව්‍ය
කෙසෙල් කඳ, උණ බට , ලී ආදී ද්‍රව්‍ය දෙකක් නම් කර තිබීම

v. මැටි ,ලී , පබළු ,කඩදාසි ,පෑන් ක්ලේ , කෝන් පිටි ක්ලේ ආදී අමුද්‍රව්‍ය දෙකක් නම් කරන්න.

vi. නිවේදක පුවරුවට ගැළපෙන මල් සැකසුමක චිත්‍රයක් ඇඳ තිබීම.

vii. තිර රාමු මුද්‍රණය,ස්ටෙන්සිල් මුද්‍රණය, ඩිජිටල් ක්‍රමය ආදී ක්‍රම දෙකක් ලියා තිබීම.

viii. චාම් වියමන,ජටා වියමන,දික්දාර වියමන,හරස්දාර වියමන ආදී වියමන් දෙකක් ලියා තිබීම.

ix. සුදුසු ඇසුරුමක රූපීය පෙනුම සඳහා ලකුණු ලබා දෙන්න.

x. $400 \times \frac{15}{100}$ = රුපියල් 60.00

= 400 + 60

= රුපියල් 460.00 (2 ×10 = ලකුණු 20)

2.

i. 

(ලකුණු 02)

Past Papers Wiki

ii. A - පාද හා කෝණවල අගය අසමාන වේ.
- සම්මුඛ පාද සමාන්තර නොවේ.

B - සම්මුඛ පාද සමාන හා සමාන්තර වේ.

- සම්මුඛ කෝණ සමාන වේ.
- විකර්ණ දිගින් අසමාන වේ.
- විකර්ණ සමච්ඡේදනය වේ. (ලකුණු 4)

iii. 10 ශ්‍රේණිය පෙළපොතෙහි 35 පිටුව හා 11 ශ්‍රේණිය පෙළපොතෙහි 16 පිටුව බලන්න.

3.

i. රිබන් මැස්ම , ලේසිඩේසි මැස්ම, ප්‍රංශ ගැට මැස්ම , කෙලින් මැස්ම , නැවි මැස්ම , ලූප් මැස්ම යන මැහුම් වර්ග දෙකක් සඳහා ලකුණු ලබා දෙන්න. (ලකුණු 2)

ii. වාසි
- නැවුම් බව
- සුවඳ
- පරිසරයට ආවේණික මල් සපයාගත හැකි වීම.
- විවිධ වර්ණවලින් විවිධ මල් වර්ග ලබා ගැනීමට හැකි වීම.

අවාසි
- කල් තබා ගත හැකි කාලය සීමිත වීම.
- එක් වතාවක් පමණක් භාවිත කළ හැකි වීම.
- මල් වර්ග අනුව මිල ගණන් විවිධ වීම.
- මල් සැකසුම්වල මල් ප්‍රමාණය අනුව බර වැඩි වීම.
- සෑම මල් වර්ගයක් ම සෑම කාලයක දී ම ලබා ගත නොහැකි වීම. (ලකුණු 4)

iii.
I. කොට්ට උරයට අවශ්‍ය රෙදි ප්‍රමාණය මැන කපා ගැනීම.
II. රෙදිකඩ පෙර පිරියම් කරගැනීම.
III. පෙර පිරියම් කළ රෙදිකඩ මුද්‍රණ තලය මත රැලි නොවැටෙන සේ රඳවා ගැනීම.
IV. මෝස්තරය මත නිසියාකාර සායම් ආලේපනය සිදුවන සේ මිරිකුම් තලය මගින් සායම් තෙරපා හැරීම.
V. රෙදිකඩ මතින් රාමුව ප්‍රවේශමෙන් ඉවත් කිරීම.
VI. මුද්‍රණය වූ රෙදිකඩ ප්‍රවේශමෙන් මුද්‍රණ තලයෙන් ඉවතට ගැනීම.
VII. මඳ පවනේ වියළීමට තැබීම.
VIII. සායම් ස්ථීර කිරීම සඳහා නොපිට හරවා උණුසුම් ස්ත්‍රික්කයකින් මැද ගැනීම.

(ලකුණු 4)

4.

i. චාම් වියමන ,ජටා වියමන, රුවිත හීරි වියමන (ඕනෑම වියමන් රටා දෙකකට ලකුණු ලබා දිය හැක) (ලකුණු 2)

ii. ඉහත සඳහන් කළ වියමන් රටා දෙක නිවැරදි ව ප්‍රස්තාර ගත කිරීම හා නම් කර තිබිය යුතු ය. (ලකුණු 4)

iii. $\frac{\text{හැඩයේ දිග} \times \text{පළල} \times 1\text{ cm ඇති නූල්}}{\text{නූල් කැරැල්ලක දිග} \times \text{නූල් අංකය}}$ නිවැරදි සූත්‍රය පිහිටුවීමට - (ලකුණු 2)

$\frac{50 \times 40 \times 60 \times 2}{1000 \times 40} = 6\text{ kg}$ පිළිතුර නිවැරදිව ලියා තිබීමට - (ලකුණු 2)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

5.

i.

මල් චක්‍රය
එතුම් රෝදය
එතුම් කූර
දික්නූල් කූර / හැඩනූල් කූර (ලකුණු 02)

ii.

කැඳහරණය
මලහරණය
විරංජනය (ලකුණු 02)
එක් පිළිතුරක් කෙටියෙන් විස්තර කිරීම (ලකුණු 02)

iii. පෙන්ගුවින් මැසීමට රෙදි තෝරා ගැනීමේ සිට නිමි භාණ්ඩය තෙක් සිදු කරන ක්‍රියාවලිය පියවර වශයෙන් ලියා තිබීම. (ලකුණු 04)

6.

i. වළං , උළු , ගඩොල් ,විසිතුරු අලංකරණ භාණ්ඩ (රතු මැටි භාණ්ඩ .....) (ලකුණු 02)

ii. සායම් ආලේප කිරීම
මුද්‍රා ක්‍රමයට අලංකරණය
ස්ටෙන්සිල් ආධාරයෙන්
විවිධ මාධ්‍ය භාවිතයෙන්
කඩදාසි ආශ්‍රයෙන් (ලකුණු 04)

iii. මැටි දරණු හෝ තහඩු භාවිතා කර මැටි භාණ්ඩයක් නිර්මාණය කරන අයුරු රූප සටහන් අනුව විස්තර කර තිබිය යුතු ය. (ලකුණු 04)

7.

i. පූර්ණ උන්නත
අර්ධ උන්නත
අල්ප උන්නත (ලකුණු 02)

ii.

-අවකාශය	- තෝරා ගත් ස්ථානය
-සම්පිණ්ඩනය	- සමබරතාවය
-අනුපාතය	- කැපී පෙනෙන සුළු බව
-විවිධත්වය	- නිමාව

(ලකුණු 02)

ඉහත මූලධර්ම දෙකක් කෙටියෙන් විස්තර කර තිබීම. (ලකුණු 02)

iii. බිතු කැටයමකට සුදුසු නිර්මාණයක් සඳහා ලකුණු ලබා දිය හැක. (ලකුණු 04)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank